# සුරාබදු ආඥාපනත

## අංක 03/2018 දරන සුරාබදු නිවේදනය

## සුරාබදු බලපත්‍ර ස්ථාන විවෘත කරනු ලබන හා වසනු ලබන වේලාවන්

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරිය වූ) 32 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා විසින් මෙම නිවේදනය මඟින් පහත උපලේඛනයෙහි දැක්වෙන සුරාබදු බලපත්‍ර ස්ථාන විවෘත කරනු ලබන හා වසනු ලබන වේලාවන් 2018 ජනවාරි 18 වැනි දින සිට බලාත්මක බව ප්‍රකාශ කරමි..

2018 ජනවාරි 10 දිනැති අංක 2053/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 01/2018 දරන සුරාබදු නිවේදනය සහ 1981 පෙබරවාරි 02 දිනැති අංක 126/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 686 දරන සුරාබදු නිවේදනය පරිච්ඡින්න විය යුතුය.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 ජනවාරි 18 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

| ***I*** ***වැනි තීරුව*** | | ***II*** ***වැනි තීරුව*** |
|---|---|---|
| ***බලපත්‍ර වර්ගය*** | | ***විවෘතව තැබිය යුතු වේලාවන්*** |
| 1. | රට බීම තැබෑරුම් බලපත්‍රය | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 |
| 2. | රා තැබෑරුම් | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 |
| 3. | හෝටල් බලපත්‍ර (ර.බී. 07) සංචාරක මණ්ඩල අනුමැතිය රහිත | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 සහ ප.ව. 5.00 සිට ප.ව. 11.00 |
| 4. | හෝටල් පීඨිකා බලපත්‍ර (ර.බී. 08) ) සංචාරක මණ්ඩල අනුමැතිය රහිත | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 සහ ප.ව. 5.00 සිට ප.ව. 11.00 |

<table>
<tr><td>5.</td><td>හෝටල් බලපත්‍ර (ර.බී. 07) සංචාරක මණ්ඩල අනුමැතිය සහිත</td><td rowspan="2">පෙ.ව. 10.00 - මධ්‍යම රාත්‍රී 12.00<br>(අවශ්‍ය වන්නේ නම් බලපත්‍රකරුගේ ඉල්ලීම මත අළුයම 02.00 දක්වා අතිරේක බලපත්‍ර වල වේලාව දීර්ඝ කිරීමට ක්‍රියා කරනු ඇත)</td></tr>
<tr><td>6.</td><td>හෝටල් පියීකා බලපත්‍ර (ර.බී. 08) සංචාරක මණ්ඩල අනුමැතිය සහිත</td></tr>
<tr><td>7.</td><td>සිනමා ශාලා සඳහා ලබා දෙන විනෝද පියීකා බලපත්‍ර (ර.බී. 09)</td><td>පෙ.ව. 11.00 සිට ප.ව. 01.00<br>ප.ව. 5.00 සිට ප.ව. 11.00<br>( දර්ශන පෙන්වන අවස්ථාවල දී පමණි)</td></tr>
<tr><td>8.</td><td>ආපනශාලා බලපත්‍ර (ර.බී. 11) සංචාරක මණ්ඩල අනුමැතිය රහිත</td><td>පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 සහ<br>ප.ව. 5.00 සිට ප.ව. 10.00</td></tr>
<tr><td>9.</td><td>ආපනශාලා බලපත්‍ර (ර.බී. 11) සංචාරක මණ්ඩල අනුමැතිය සහිත</td><td>පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 සහ<br>ප.ව. 5.00 සිට ප.ව. 11.00</td></tr>
<tr><td>10.</td><td>පරිශ්‍රය තුළ දී පරිභෝජනය කරන බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් බලපත්‍ර (ර.බී. 22 බී) (සංචාරක මණ්ඩල අනුමැතිය රහිත පරිශ්‍රයන් සඳහා)</td><td>පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 සහ<br>ප.ව. 5.00 සිට ප.ව. 10.00</td></tr>
<tr><td>11.</td><td>පරිශ්‍රය තුළ දී පරිභෝජනය කරන බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් බලපත්‍ර (ර.බී. 22 බී) (සංචාරක මණ්ඩල අනුමැතිය සහිත පරිශ්‍රයන් සඳහා)</td><td>පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 සහ<br>ප.ව. 5.00 සිට ප.ව. 11.00</td></tr>
<tr><td>12.</td><td>තානායම් බලපත්‍ර (ර.බී.12)</td><td>පෙ.ව. 11.00 සිට ප.ව. 11.00</td></tr>
<tr><td>13.</td><td>දුම්රිය ආපනශාලා බලපත්‍ර (ර.බී.10)</td><td>පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 සහ<br>ප.ව. 5.00 සිට ප.ව. 08.00</td></tr>
<tr><td>14.</td><td>සමාජ ශාලා බලපත්‍ර (ර.බී. 13 ඒ) (සාමාජිකයින් සඳහා පමණයි)</td><td>පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 සහ<br>ප.ව. 5.00 සිට ප.ව. 11.00</td></tr>
<tr><td>15.</td><td>හිමිකාර සමාජශාලා බලපත්‍ර (ර.බී. 13)</td><td>පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 සහ<br>ප.ව. 5.00 සිට ප.ව. 11.00</td></tr>
<tr><td>16.</td><td>විදේශ මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර (ර.බී. 04)</td><td rowspan="2">පෙ.ව. 08.00 සිට ප.ව. 08.00 හෝ<br>පෙ.ව. 09.00 සිට ප.ව. 09.00</td></tr>
<tr><td>17.</td><td>බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් සිල්ලරට විකිණීමේ බලපත්‍ර (ර.බී. 22 ඒ)</td></tr>
</table>